විභාග අංකය :

......................................

# රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

## දීප ව්‍යාප්ත භාෂා පුහුණු වැඩසටහන

| කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි. | |
|---|---|
| ප්‍ර.අංක | ලකුණු |
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |
| 6. | |
| 7. | |
| 8. | |
| 9. | |
| 10. | |
| එකතුව 100% | |
| 30% | |

**අවසාන පරීක්ෂණය 2008**

**සිංහල භාෂාව I මට්ටම (නව නිර්දේශය)**

**ප්‍රශ්න පත්‍ර අංක 2**

**2008.09.27**

**කාලය පැ තුනයි.**

**ලකුණු 30 යි**

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.**

1. පහත දැක්වෙන අකුරු මුලට මැදට හෝ අගට යොදමින් එක් අකුරට එක් වචනය බැගින් වචන 10 ක් ලියන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | ගා | .............................. | (ii) | ච | .............................. |
| (iii) | ස | .............................. | (iv) | ඇ | .............................. |
| (v) | ඓ | .............................. | (vi) | ඩ | .............................. |
| (vii) | භ | .............................. | (viii) | ණ | .............................. |
| (ix) | ශ | .............................. | (x) | ළ | .............................. |

2. පහත සඳහන් යෙදුම්වල සදොස් තැන් ඇතොත් නිදොස් කරන්න.

(i) සාහිත්‍ය සම්ප්‍රධාය ...........................................................................

(ii) ප්‍රාදේසීය සභා ...........................................................................

(iii) ෛඓතිහාසික විමර්ශනය...........................................................................

(iv) විවිද සේවා සමුපකාර සමිති ...........................................................................

(v) මුදල් අමාත්‍යාංසය ...........................................................................

(vi) පාඨසාලා සංවර්ධන සමිති...........................................................................

(vii) යුධ හමුදාව ...........................................................................

(viii) සංස්කෘතික භාෂාව ...........................................................................

(ix) ආධුනිකත්ව මණ්ඩලය ...........................................................................

(x) පොත් ප්‍රදර්ශණය ...........................................................................

3. දී ඇති වචනවලට විරුද්ධාර්ථ වචන දෙන්න.

| | | | |
|---|---|---|---|
| (i) | ප්‍රමාණ .............................. | (ii) | ඌන .............................. |
| (iii) | වින්දන .............................. | (iv) | අපේක්ෂිත.............................. |

(v) ප්‍රයෝජන………………………… (vi) සනීප ..........…………………..

(vii) සම්මත………………………… (viii) මිහිරි………………………..

(ix) කීර්තිය………………………… (x) ආදිමත් …………………………..

4. සන්ධි කරන්න.

(i) මහා + උපකාර ……………………………………………………………

(ii) ප්‍රඥා + ආලෝකය ……………………………………………………………

(iii) අති + අවශ්‍ය ……………………………………………………………

(iv) විරුද්ධ + ආකල්ප ……………………………………………………………

(v) සීමා + අන්තික ……………………………………………………………

(vi) ග්‍රාම + උදය ……………………………………………………………

(vii) ක්‍රම + අනුකූල ……………………………………………………………

(viii) අමාත්‍ය + අංශය ……………………………………………………………

(ix) අන්‍ය + අන්‍ය ……………………………………………………………

(x) ග්‍රාම + ආරක්ෂක ……………………………………………………………

5. අදාළ වාක්‍යයේ යෙදිය හැකි නිවැරදි වචනය වරහන් තුළ ඇති වචනවලින් තෝරා ලියන්න.

(i) පරිසරය ආරක්ෂා කළ යුතු බව අමාත්‍යවරයා ප්‍රකාශ .................................... (කළාය, කළේය)

(ii) සේවක සුභ සාධනය පිණිස කම්කරු අමාත්‍යවරයා නව නීති ................................. (පනවයි, පනවති)

(iii) ශිෂ්‍යයෝ දේශනවලට ....................................... (සහභාගී වෙයි, සහභාගී වෙති)

(iv) ..................................... (පක්ෂියා, පක්ෂීහු) උණුසුම් ප්‍රදේශවලට පියාඹති.

(v) අමාත්‍යවරයා .................................. (සේවකයෝ, සේවකයන්) සමඟ සාකච්ඡා කරයි.

(vi) .........................................(අග්‍රාමාත්‍යතුමා, අග්‍රාමාත්‍යතුමාණෝ) සම්මේලනයට සහභාගී වූහ.

(vii) සේවක අර්ථසාධක අරමුදල පෞද්ගලික අංශයේ ....................................................... ( සේවකයෝ, සේවකයන්) සඳහාය.

(viii) ..........................................(චූදිතයෝ, චූදිතයන්) අධිකරණයට ඉදිරිපත් කරනු ලැබූහ.

(ix) එම ප්‍රකාශය කරනු ලැබුයේ .............................................. (අමාත්‍යවරයෙක්, අමාත්‍යවරයෙකු) විසිනි.

6. නිවැරදි වාක්‍යය යටින් ඉරක් අඳින්න.

(i) (අ) අමාත්‍යවරයා රැස්වීම් ශාලාව විවෘත කළාය.
(ආ) අමාත්‍යවරයා රැස්වීම් ශාලාව විවෘත කළේය.
(ඇ) අමාත්‍යවරයා රැස්වීම් ශාලාව විවෘත කළහ.

(ii) (අ) විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කෙරේ.
(ආ) විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කෙරෙති.
(ඇ) විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කරයි.

(iii) (අ) පාසශාලා ආචාර්යවරුන් නැණවතුන් වෙති.
(ආ) පාසශාලා ආචාර්යවරු නැණවත්හු වෙති.
(ඇ) පාසශාලා ආචාර්යවරු නැණවතුන් වෙයි.

(iv) (අ) පාරිභෝගිකයන්ට ප්‍රතිලාභ ලැබෙති.
(ආ) පාරිභෝගිකයන්ට ප්‍රතිලාභ ලැබේ
(ඇ) පාරිභෝගිකයන්ට ප්‍රතිලාභ ලබයි

(v) (අ) පළාත් සභාව ප්‍රාදේශීය අවශ්‍යතා සම්පූර්ණ කරයි.
(ආ) පළාත් සභාව ප්‍රාදේශීය අවශ්‍යතා සම්පූර්ණ කරති.
(ඇ) පළාත් සභාව ප්‍රාදේශීය අවශ්‍යතා සම්පූර්ණ කරනු ලැබේ.

7. එක් එක් වාක්‍යයේ සලකුණු කරන ලද යෙදුම්වල සමීප අර්ථයක් ඇති යෙදුම (අ), (ආ) හා (ඉ) යෙදුම්වලින් තෝරා, සලකුණු කරන්න.

(i) අධිකාරිය සංවර්ධන සැලසුමේදී ව්‍යාපෘති පිළිබඳ විස්තරාත්මක **<u>අධ්‍යයනයක්</u>** කළ යුතුය.

(අ) ඉගෙනීම (ආ) ඉගැන්වීම (ඉ) මනාසේ කරුණු සලකා බැලීම

(ii) **<u>මාධ්‍යවේදීන්</u>** සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ අරමුදලක් පිහිටුවා ඇත.

(අ) ග්‍රන්ථ කර්තෘවරුන් (ආ) ග්‍රන්ථ ප්‍රකාශකයන්
(ඉ) මහජනතාව වෙත පුවත්පත් ආදිය මගින් තොරතුරු සපයන්නන්.

(iii) අධිකාරිය විසින් නිලධරයන්ට හා සේවකයන්ට ගෙවිය යුතු **<u>පාරිශ්‍රමිකය</u>** තීරණය කළ යුතුය.

(අ) අරමුදල් (ආ) ප්‍රතිලාභ (ඉ) දීමනා

(iv) **<u>නිර්දිෂ්ට</u>** පළිබෝධකයකු පාලනය කිරීම පිණිස අනුමත ඖෂධ සංයෝග යෙදීම කළ හැකිය.

(අ) පරිසර දූෂණය කරන්නා (ආ) පරිසරය ආරක්ෂා කරන්නා
(ඉ) භෝග වර්ගවලට හානි කරන කෘමීන් හා දිලීර

(v) යම් ප්‍රාදේශීය සභාවක් තුළ සම්මත කරනු ලැබූ ප්‍රදේශයක් තුළ වර්ෂා ජලය හෝ අපවහන ජලය හෝ **නිර්බාධිතව** ගසායෙන යාමට අවහිර කිරීම නීති විරෝධී ක්‍රියාවකි.

(අ) බාධා සහිතව (ආ) කිසිදු බාධාවක් නොමැතිව (ඉ) ආරක්ෂා සහිතව

8. පහත සඳහන් පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) හින්දු දර්ශනය විශ්ව ශක්තිය නැමති පදනම මත වැඩී ගිය එකකි. පෙරදිග දර්ශන අතුරෙන් හින්දු දර්ශනය ප්‍රමුඛ ස්ථානයක සිටිනුයේ විශ්වය තුළ පවතින ශක්තීන් පූජාවට සුදුසු ලෙස සලකා වන්දනාවට පාත්‍ර කළ හෙයිනි. විශ්වය තුළ ඇති ස්වාභාවික ශක්තියේ ප්‍රතිඵලයක් ලෙස බිහි වූ මනුෂ්‍යයා තුළ තිබෙන ශක්තීන් කෙරෙහි ද හින්දු දර්ශනයේ අවධානය යොමු වෙයි. මුල් හින්දු ආගමික විශ්වාස අතර පුරුෂ හා ස්ත්‍රී ශක්තීන් පිළිබඳ ඉන්දීය ශිෂ්ටාචාරයේ පදනම සේ සැලකෙන ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් ද මේ වන විට සාක්ෂි ලැබී තිබේ. ජගත් මාතා හා පුරුෂ දෙවියන් පිදීම සඳහා යොදාගත් මුද්‍ර හා මූර්ති මීට නිදසුන් ය.හින්දු ආගමේ එන මැවුම් වාදයෙන් කියැවෙන්නේ බ්‍රහ්ම විසින් ඔහුගේ ශරීරයෙන් මනුෂ්‍යයා බිහි කළ බවයි. මනුෂ්‍යයා සතුව පවතින සියලු ශක්තීන්හි ප්‍රභවය පිළිබඳ කිසියම් අදහසක් එයින් පළ වෙයි. මුල් අවධියේ දී හින්දු ආගමේ ප්‍රතිමා වන්දනාවක් නොතිබිණි. එය පසුකාලීන ආරම්භ වූ බවට පුරා විද්‍යාත්මක සාක්ෂි තිබේ.

(i) මෙම ඡේදයෙන් කියැවෙන්නේ කවරක් පිළිබඳව ද?

..........................................................................................

(ii) හින්දු දර්ශනය ප්‍රමුඛ ස්ථානයකට පත්වන්නේ ඇයි?

..........................................................................................

(iii) ඉන්දීය ශිෂ්ටාචාරයේ පදනම ලෙස සැලකෙන්නේ කුමක් ද?

..........................................................................................

(iv) හින්දු ආගමේ එන මැවුම්වාදයෙන් කියැවෙන්නේ කුමක් ද?

..........................................................................................

(v) ප්‍රතිමා වන්දනාව, හින්දු ආගමේ මුල පටන්ම පැවතිණි ද?

..........................................................................................

(ආ) අනුමතය ප්‍රදානය කොට ඇති යම් නියමිත ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් වෙනස් කිරීම් කිසිවක් සිදු කරනු ලබන අවස්ථාවක හෝ දැනටමත් අනුමත කොට ඇති යම් නියමිත ව්‍යාපෘතියක් අතහැර දමනු ලබන අවස්ථාවක, එවැනි අනුමතයක් ලබාගත් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුව, සංස්ථාව, ව්‍යවස්ථාපිත මණ්ඩලය, පළාත් පාලන ආයතනය, සමාගම, වෙළඳ ආයතනය හෝ පුද්ගලයා විසින් උචිත ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනය වෙත අවස්ථාවෝචිත පරිදි ඒ වෙනස් කිරීම හෝ අත්හැර දැමීම හෝ පිළිබඳව දැනුම් දිය යුතු අතර, අවශ්‍ය අවස්ථාවක, දැනටමත් අනුමතය ප්‍රදානය කොට ඇති එවැනි නියමිත ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් කිරීමට අදහස් කරනු ලබන වෙනස් කිරීම් කිසිවක් සම්බන්ධයෙන් නැවත අනුමතය ලබා ගත යුතුය.

එසේ වුවද, අතහැර දමනු ලබන හෝ වෙනස් කරනු ලබන ඒ නියමිත ව්‍යාපෘතිය, අධිකාරයේ එකඟත්වය ඇතිව අනුමත කරන ලද ව්‍යාපෘතියක් වන අවස්ථාවක, ඒ සම්බන්ධයෙන් අධිකාරියටද දැනුම් දෙනු ලැබිය යුතු අතර, ලබා ගැනීමට අවශ්‍ය වන්නා වූ යම් අලුත් අනුමතයක් අධිකාරයේ එකඟත්වය ඇතිව පමණක් දෙනු ලැබිය යුතුය.

(i) රජයට සම්බන්ධ නියමිත ව්‍යාපෘතිවලට අනුමතය ලබා ගන්නේ කවර ආයතනයකින් ද?

..........................................................................................

(ii) අනුයෝජිත ආයතනය යනු කුමක් ද?

.......................................................................................

(iii) නියමිත ව්‍යාපෘති අතහැර දැමීම කළ හැකි ද?

.......................................................................................

(iv) නියමිත ව්‍යාපෘති පිළිබඳ වෙනස්කම් ඇති කළ හැකි ද?

.......................................................................................

(v) අතහැර දැමීම සහ වෙනස් කිරීම පිළිබඳ ව කවරක් පළමුවෙන් කළ යුතු ද?

.......................................................................................

9. පහත සඳහන් ඉංග්‍රිසි ඡේද දෙක හෝ දෙමළ ඡේද දෙක හෝ සිංහල භාෂාවට පරිවර්තනය කරන්න. (ලකුණු දෙනු ලබන්නේ එක් භාෂා මාධ්‍යයකින් පරිවර්තනය කරනු ලබන පරිවර්තනයකට පමණි)

(i) The human life during it's span of existence is subject to various forms of contingencies like morbidity, disability, incapacity, old age infirmity etc. and is ultimately terminated in mortality. Sri Lanka's success in reducing mortality and morbidity in it's population had been recorded remarkable in comparison to most of the developing countries. However social aspects of disability, incapacity and old age infirmity are yet to be received further attention. These contingencies which are most probably the end results of morbidity, accidents, violence etc. do impose economic hardships to the individual and further lead to social consequences on the population as a whole. Most developed countries have various forms of Social Security Schemes introduced in their countries to sustain human life against the fate of these contingencies.

(ii) In Sri Lanka, the majority of women, especially from underprivileged groups, whether they live in rural, semi-urban or urban areas are responsible for meeting most of the family's basic needs for food, fuel and water supplies. They have a strenuous workload, often working 14 to 17 hours a day. Women provide 60% to 80% of agricultural labour. Food processing and preservation of vegetables and fruits, salting and smoking of fish, etc., are predominantly women's work. Urban or semi-urban women who are not employed in the formal sector usually carry out a variety of micro or small scale income – generating activities in addition to their household chores. Studies on the usage of technology by women in Sri Lanka have revealed that the majority have to carry out these responsibilities with inappropriate or outdated equipment and little or no technical training or knowledge.

(iii) மத வழிபாட்டுத்தலங்களை அமைப்பது தொடர்பில் புதிய விதிமுறைகளை அரசாங்கம் உடனடியாக அமுலுக்குக் கொண்டு வந்துள்ளது. இதன்பிரகாரம் நாட்டின்எந்தவொரு பகுதியிலும்எந்தவொரு மதத்தலமும் நினைத்த படி அமைக்கமுடியாது. சமய விவகார அமைச்சின் அங்கீகாரம் பெற்றுக்கொள்ளப்பட்டதன் பின்னரே அவை அமைக்க முடியும்.

பௌத்த விகாரைகள், இந்து ஆலயங்கள், முஸ்லிம் பள்ளிவாசல்கள், கிறிஸ்தவ ஆலயங்கள் உள்ளிட்ட அனைத்து மதங்களினதும் வழிபாட்டுத் தலங்கள் கண்ட படி அமைக்கப் படுவதால் இனங்களுக்கிடையே முரண்பாடுகளும், மோதல்களும் ஏற்பட்டுவருவதால். புதிய விதிமுறைகள்உடனடியாக அமுலுக்குக் கொண்டுவரப்பட்டிருப்பதாக சமய விவகார அமைச்சின் செயலாளர் எச்.எம்.ஹேரத் தெரிவித்தார்.

புதிய விதிமுறைக்கமைய அமைச்சின் அங்கீகாரம் பெறப்பட்டதன் பின்னரேவழிபாட்டுத்தலங்கள் அமைக்கப்பட முடியும். இது குறித்து சுற்று நிருபம் உடனடியாக மாகாணசபைகள், உள்ளூராட்சிச்சபைகளுக்கு அனுப்பிவைக்கப்பட்டிருப் பதாக செயவாளர் ஹேரத் தெரிவித்தார்.

(iv) அதிகரித்துச் செல்லும் பொருட்கள் சேவைகளின் விலையேற்றம் காரணமாக பாதிக்கப்படும் பொது மக்களில் பெருந்தோட்டத் துறையைச் சேர்ந்தவர்கள் மிகுந்த நெருக்கடிகளுக்கும் கஷடங்களுக்கும் ஆளாகி வருகின்றனர். காரணம் அவர்கள் முழுக்க முழுக்க அன்றாட வேதனத்தையே நம்பி தங்கள் வாழ்க்கையை நகர்த்தி வருகின்றனர். அதேவேளை, வெளியாருடன் ஒப்பிடுகையில் அவர்கள் பெறும் நாட் சம்பளம் மிகவும் குறைந்ததாகும். இதனால், அவர்கள் மூன்று வேளை உணவை தேடிக்கொள்வதே மிகுந்த சிரமமான காரியமாக இருந்து வருகின்றது.

சாராரணமாக அன்றாடம் கூலித் தொழிலில் ஈடுபடும் ஒருவர் 600 ரூபா தொடக்கம் 1000 ரூபா வரை சம்பளமாக பெற்றுவரும் நிலையில் தோட்டத் தொழிலாளர்கள் நாளொன்றுக்கு ஒட்டுமொத்தமாக 290 ரூபா சம்பளத்தையே பெற்று வருகின்றனர். இதனால் அவர்கள் தமது அன்றாட செலவினங்களை சமாளிக்க முடியாத நிலைக்கு தள்ளப்பட்டுள்ளனர்.

சாதாரணமாக பொருட்களின் விலையேற்றங்களுக்கு ஏற்ப அரசாங்க மற்றும் தனியார் துறையினருக்கு ஏதேனும் ஓர் வகையில் நிவாரணங்கள், சம்பள உயர்வுகள் என்பன கிடைக்கும் அதே வேளை, தோட்டத் தொழிலாளர்களுக்கு எந்த விதமான வருமானமும், சம்பள உயர்ச்சியும் கிடைப்பதில்லை. அது தொடர்பான எதிர் பார்ப்புக்கள்கூட இல்லாத நிலைமையிலேயே அவர்கள் வாழ வேண்டிய நிலைக்குத்தள்ளப்பட்டுள்ளனர்.

……………………………………………………………………………………………..

……………………………………………………………………………………………..

……………………………………………………………………………………………..

……………………………………………………………………………………………..

……………………………………………………………………………………………..

……………………………………………………………………………………………..

……………………………………………………………………………………………..

……………………………………………………………………………………………..

……………………………………………………………………………………………..

……………………………………………………………………………………………..

……………………………………………………………………………………………..

……………………………………………………………………………………………..

……………………………………………………………………………………………..

……………………………………………………………………………………………..

……………………………………………………………………………………………..

……………………………………………………………………………………………..

……………………………………………………………………………………………..

……………………………………………………………………………………………..

10. පහත සඳහන් ඡේද දෙක දෙමළ භාෂාවට හෝ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරන්න.( ලකුණු දෙනු ලබන්නේ එක් භාෂා මාධ්‍යයකින් පරිවර්තනය කරනු ලබන පරිවර්තනයකට පමණි)

(i) 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව යමින් 1987 දී ශ්‍රී ලංකාවේ රජයේ සෞඛ්‍ය සේවා කළමනාකරණය සහ පරිපාලනය විමධ්‍යගතකරණය කිරීම ආරම්භ කරනු ලැබීය. 1987 පිහිට වූ පළාත් සභාවලට සෞඛ්‍ය සේවා ද ඇතුළුව කාර්යයන් ගණනාවකම වගකීම පවරන ලදී. අනතුරුව 1992 දී ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිහිටුවීමත් සමඟම එක් එක් පළාත් තුළ පැවති සියලුම පරිපාලන අයතන විධිමත් සංවිධානාත්මක රාමුවත් යටතට ගෙන එන ලදී. මේ අනුව ප්‍රාදේශිකයක සෞඛ්‍ය සේවා පරිපාලනය සමඟ කළමනාකරණය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් වෙතට පවරන ලදී. මැලේරියා මර්දන ව්‍යාපාරය වැනි වූ සිරස් වැඩසටහන් 1980 ගණන්වල අගභාගයේදී අහෝසි කරනු ලදුව විකිත්සක සහ නිවාරණ යන සේවාවන් දෙකම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්ගේ ඍජු පාලනය යටතට ගෙන එන ලදී.

(ii) ආහාරයෙන් ස්වයං පෝෂිත වීම සඳහා දේශීය ආහාර නිෂ්පාදනය වැඩි කිරීමේ වැදගත්කම සංවර්ධනය වන රටවල් රාශියක් විසින්ම අවධාරණය කරනු ලැබ තිබේ. නමුත් මේ දක්වා සිය ආහාර ස්වයංපෝෂිත බව ලබා ගැනීමට සමත් වී ඇත්තේ රටවල් ස්වල්පයක් පමණි. ආනයනයන් සඳහා මුල්‍ය සම්පාදනය කිරීමේ හැකියාවක් තිබේ නම් දේශීය නිෂ්පාදනය මත යැපෙනවාට වඩා සිය ආහාර සැපයුම්වලින් එක්තරා කොටසක් ආනයනය කිරීම කෙරෙහි විශ්වාසය තැබීම බොහෝ රටවලට වඩා හොඳ වන්නට පුළුවන. ආහාර ද්‍රව්‍ය ආනයනය කිරීමට රටක් සතු හැකියාව රඳා පවතින්නේ ලෝක ආහාර මිල ගණන් සහ තමාගේ විදේශ විනිමය ලැබීමේ හැකියාව යන කරුණු මත බව පැහැදිලිය.

………………………………………………………………………………………………

………………………………………………………………………………………………

………………………………………………………………………………………………

………………………………………………………………………………………………

………………………………………………………………………………………………

………………………………………………………………………………………………

………………………………………………………………………………………………

………………………………………………………………………………………………

………………………………………………………………………………………………

………………………………………………………………………………………………

………………………………………………………………………………………………

………………………………………………………………………………………………

………………………………………………………………………………………………

………………………………………………………………………………………………

………………………………………………………………………………………………

………………………………………………………………………………………………

………………………………………………………………………………………………